# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 14
NUMBER 10

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

FEBRUARY 10, 2012 පෙබරවාරි මාසය (බුද්ධ වර්ෂ 2555 නවම් මාසය)    http://www.lankaheritage.com/lankaviththi/




මොහොතකට ඉඩ ලදිමි - සිඹින්නට ඇතිල්ලී
මගේ උණුසුම දැනී - සිටියි ඔහු නොසෙල්ලී
තුරුළුකර සුරැකි ලෙස - මගෙ සිඟිති මල්ලී
අනේ! ඇත්නම් යන්න - අහසට ඉගිල්ලී

Having a momentary chance
to kiss and be close
Huddled in my warmth
he stays happy; and it shows
Clasping safely, my cuddly little brother...
Only if I could fly away, skyward rather...

♦ *දයා ආනන්ද* ♦ *Daya Ananda Ranasinghe*

# රටට අවශ්‍ය 13 නොවේ! උගත් පාඩම්ය! ඒවා කෝ?

♦ **සංජය විමලරත්න විසිනි**

**මු**ලින්ම මේ **13A** යනු කුමක් දැයි සහ එය කෙසේ පටන්ගත් තේද්‍යයි ඔබට පහදා දෙනු කැමැත්තෙමි.

**13 th Amendment** හෙවත් **13** වන සංශෝධනය වනාහි දැනට අවුරුදු 25 කට පෙර ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළ අවස්ථාවේ එදා තිබූ විවාදාත්මක තත්වයන් යටතේ එකල රජය විසින් අපේ රාජ්‍ය ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද එක්තරා වගන්ති මාලාවකි. ඒ යටතේ ශ්‍රීලංකාවේ පළාත් සභා පිහිටුවන්නටද ඒවාට පොලිස් සහ ඉඩම් බලතල පවරන්නටද නියමිත වීය. එය පළාත් සභාවලට බලය බෙදා දීමක් ලෙස ද අර්ථකථනය විය. මෙහි හොඳ නරක සහ ඉෂ්ඨ අනිෂ්ඨ විපාක ගැන බොහෝ මතිමතාන්තර දේශපාලනඥයින්ද විද්වතුන් ද ඉදිරිපත් කළ අතර අන්තිමේ ඉඩම් පොළිස් බලතල නැතිව පළාත් සභා පිහිටුවා ඒවා ක්‍රියාත්මක කර වීය. හොඳට හෝ නරකට හෝ මේ දක්වාම එසේ සිදුවෙමින් පවතින්නේය.

## 13 A plus

පසුගිය වසරේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට ඉන්දීය අගමැති මන්මෝහන් සිං මහතා හමුවූ වෙලේ ලංකාවේ තත්වය ගැන කළ කතාබහේදී ඔහු ජනාධිපතිවරයාගෙන් ඇසුවේ ඉන්දියාව කලක් තිස්සේ ලංකාවෙන් අසන ඔවුන්ගේ ප්‍රියතම ප්‍රශ්නයයි. එනම් ලංකාව එහි ජනවාර්ගික ප්‍රශ්නවලට විසඳුම් වශයෙන් 13 වන සංශෝධනය ක්‍රියාත්මක කරමින් බලය බෙදා දීමේ වැඩපිළිවෙල දියත් කරන්නේ කවදා ද? යන්නයි.

එයට පිලිතුරු වශයෙන් ලංකා ජනාධිපතිවරයා ඉන්දීය අගමැතිට මෙසේ කීවේය.

" 13 වන සංශෝධනය නෙවෙයි අපි **13**නුත් එහා **(13A plus)** යන්න බලාපොරොත්තු වෙනවා."

එහෙත් ඒ කී කතාවේ තේරුම කුමක්දැයි කිසිවෙකුත් නොදනී. ජනාධිපතිවරයා එය පැහැදිලි කළේ ද නැත. **13** ටත් එහාට යන කතාව අපේ මාධ්‍ය මගින්ද දෙමළ දේශපාලනඥයින් ද තම හිතුමතයට වහා අර්ථ කථනය කළේ මෙසේය.

" ඒ කියන්නේ පොලිස් සහ ඉඩම් බලතල සියල්ල ද පළාත් සභාවල මහ ඇමතිට දෙමින් පළාත් සභා ක්‍රියාත්මක කරනවාය කියන එකයි."

දෙමළ ජාතික සංධානය **(TNA)** දැන් ඉල්ලා සිටින්නේ ජනාධිපතිවරයා ඒ කියන ලද **13A plus** එක පුළුවන් ඉක්මනින් දෙන්න කියාය. ඔවුන් ඉන්දියාවට ආයාචනා කරන්නේද කෙසේ හෝ **13A plus** එක අපට ඉල්ලලා දෙන්න යනුවෙනි. එහි කියන විදියට පොලිස් බලතල සහ ඉඩම් බලතල ලැබුණොත් තව සැරයක් ඊළමකට වැයම් කරන්නට චාන්ස් එකක් ලැබෙනවා යයි ඔව්හු කල්පනා කරති.

මේ **13** නේ කතාව දැන් ලංකාවේ දේශපාලන කතබහේ ප්‍රධාන මාතෘකාව බවට පත්ව තිබේ. තවමත් ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශ බළල් අත්ද, කොටි හිතවාදී මාධ්‍ය කරුවෝද, **NGO** කාරයෝද දැන් වෙබ් අඩවි හදාගෙන 13 **plus** ගැනම ලියති. විවාද පවත්වති. රජය කරන සංවර්ධන කටයුතු ගැන හෝ උතුරේ සහ නැගෙණහිරේ රජය මගින් ක්‍රියාත්මක කර ඇති පුනරුත්ථාපන කාර්යයන් කිසිවක් ගැන හෝ ඔවුන් වචනයක් වත් ලියන්නේ හෝ කතා කරන්නේ නැත. තවමත් කියන්නේ දෙමළ ජනතාවගේ ප්‍රශ්න විසඳී නැති බවයි. පොලිස් බලතල සහ ඉඩම් බලතල දුන්නොත් ප්‍රශ්නවලට ටිකක් හෝ සහනයක් ලැබේ යයිද කියති. කොටි ත්‍රස්තවාදීන් අවුරුදු 30 ක් තිස්සේ කුරිරු ඝාතන හා විනාශයන් සිදුකළ බවත්, ප්‍රශ්ණ තිබුණේ ඒ කාලයේ බවත්, ඒ ප්‍රශ්න ඇති කළේ ඒ ඝාතකයින් බවත් උන් කියන්නේ නැත. දැන් ඒ සියල්ලෙන් මිදුණු සහනයක් උතුරට හා නැගෙණහිරට ලැබී ඇති බවත් මුන් කිසිවෙක් කියන්නේ නැත.

**13A+** (struck through)

**LLRC ✔**

## LLRC ( Lessons Learnt and Reconcilliation Commission)

## උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම හෙවත් කමිටුව **2010** වසරේදී ශ්‍රීලංකා ජනාධිපතිවරයා විසින් පිහිටුවන ලද්දේ ඉන් විශේෂ කාර්යයක් ඉටුකරගන්නා බලාපොරොත්තු වෙනි.

වසර **30** ක් තිස්සේ පැවති කුරිරු යුද්ධය අවසන් වූයේ ත්‍රස්තවාදී කණ්ඩායම මුළුමනින්ම සහ සාර්ථක අන්දමින් පරාජයට පත්කිරීමෙනි. එතැන් සිට රට නව අරමුණක් කරා යන මගට පිවිසිය යුතුය. එසේ ඒ ගමන ආරම්භ කරන්නට නම් ඒ යුද්ධයෙන් උගත්පාඩම් මොනවාදැයි විමර්ශනයට ගත යුතු වෙයි. එසේම යුද වැදුණු දෙපාර්ශ්වය අතරේ සමාදානාත්මක එකඟතාවක් ඇතිවිය යුතු වෙයි. ඉහතකී කමිටුව පිහිටුවීමේ අරමුණ එය වීය.

ත්‍රස්තවාදී යුද්ධය පටන් ගත් දිනයේ සිට එය පැවති මුලු මහත් කාල වකවානුව පුරාම ඒ යුද්ධය ඇතිවීමට පුන පුනා කියැවුණු හේතු කාරණා අතර ප්‍රධාන වූයේ දෙමළ ජනතාවගේ ප්‍රශ්න හා දුක්කම්කටොලු වලට හරියාකාර විසඳුමක් නොලැබුණු නිසා යුද්ධය ඇතිවූ බවයි. ඉස්මතුව ආයේ දෙමළ ජනතාව පමණක් වුවද, සැබැවින්ම ශ්‍රීලංකාවේ අනෙක් ජනතාවටද බහුතර සිංහළ අයටද දුක් ගැනවිලි හා ප්‍රශ්න බොහෝ තිබෙන බව ලංකාවේ ජීවත් වන කවුරුත් දනිති. කෙසේ හෝ දැන් යුද්ධය අවසන් වූ නිසා මේ ප්‍රශ්න ගැන සොයා බලන්නට කාලය එළඹියේය. එමගින් යළි එවැනි යුද්ධයක් ඇති නොවන්නට වගබලාගන්නට හැකිවන්නේය.

උගත් පාඩම් කමිටුවට සාක්ෂි දෙන්නට, කරුණු ඉදිරිපත්කරන්නට බොහෝ දේශපාලකයෝ ආහ. විද්වත්හු ආහ. විවිධ ආගමික නායකයෝ ආහ. ශ්‍රීලංකාවේ පැවති අර්බුදය ඔවුන් දුටු ආකාරය ද, ඊට හේතුභූත වන්නට ඇතැයි ඔවුන් සිතූ දේවල් ද, සිදුවූ අඩුපාඩුකම් ද එසේම ඒවාට සුදුසුයයි ඔවුන් සිතූ විසඳුම්ද මෙම උගත්පාඩම් කොමිසම ඉදිරියේ සති කීපයක් පුරා දිග හැරිණ. අවසන මේ සියල්ලේ වාර්තාවක් ජනාධිපතිවරයා ඇතුලු රජයට දෙන ලදී. රජය එම වාර්තාවට අනුව ක්‍රියා කරන්නට සූදානමින් සිටියි. සැබැවින්ම විය යුත්තේද එයයි. වෙනකිසිවක් නොවේ. ඒ අතරේ විවිධ බලවේග දැන් **13** කතාවක් ඉදිරියට ගෙන එන්නේ සියල්ල අවුල්කර දැමීමටය. රජය මේ **13** උස්සා කුණු බක්කියට දැමිය යුතුය.







විස්තර පිටු අංක 3